සලාතය ඉටු කළ යුත්තේ කෙසේ ද?

සලාතය නම් ශ්‍රේෂ්ඨ සංකේතාත්මක පිළිවෙත
ඉටු කරනාකාරය ගැන විස්තරාත්මක හා
රූපිත විග්‍රහයක්

සලාතය ඉටු කළ යුත්තේ කෙසේ ද?

සලාතය නම් ශ්‍රේෂ්ඨ සංකේතාත්මක
පිළිවෙත ඉටු කරනාකාරය ගැන
විස්තරාත්මක හා රූපිත විග්‍රහයක්

مركز أصول
OsoulCenter

ⓒ **جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة ، ١٤٤٦ هـ**

مركز أصول

كيف أصلي: شرح مصور لكيفية الصلاة مع وقفات مع هذه الشعيرة العظيمة باللغة السنهالية. / مركز أصول - ط ١. .- الرياض ، ١٤٤٦ هـ

٥٠ ص ؛ ١٤.٨ x ٢١ سم

رقم الإيداع: ١٤٤٦/١٨٩٧٦

ردمك: ٣-٩٢-٨٤٣٨-٦٠٣-٩٧٨

Osoul Center
www.osoulcenter.com

- **මෙම අනුවාදය උක්ත මධ්‍යස්ථානය විසින් සකස් කර නිර්මාණය කරන ලදී.**
- **මෙම මධ්‍යස්ථානය පිළිබඳ සඳහන් කර පාඨය වෙනස් නොකර ඕනෑම ආකාරයකින් මෙම සංස්කරණය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට උක්ත මධ්‍යස්ථානයේ අනුමැතිය හිමි වේ.**
- **මුද්‍රණය කිරීමේදී, උසූල් මධ්‍යස්ථානය විසින් අනුමත කරන ලද තත්ත්ව ප්‍රමිතීන් පිළිපැදිය යුතුය.**

بسم الله الرحمن الرحيم

අපරිමිත දයාවන්ත අසමසම කරුණාවන්ත අල්ලාහ්ගේ නාමයෙන්

පෙරවදන

සර්ව පැසසුම් විශ්ව පරමාධිපති අල්ලාහ්ට ම ය, අප දේව දූත මුහම්මද්තුමාණන් කෙරෙහි ද එතුමාණන්ගේ පවුල හා මිත්‍රාදි සැම කෙරෙහි ද මහිමාන්විත අල්ලාහ් ආසිරි හා ශාන්තිය උදා කරන සේක්වා! එපරිදි,

ඉස්ලාමය වනාහි ඉහ්සාන් හෙවත් මිනිසා සහ ඔහුගේ පරමාධිපති අතර පවත්නා යහ සබඳතාවය මෙන් ම මිනිසා සහ අනෙකුත් මිනිසුන් අතර පවත්නා යහ සබඳතාවය ස්ථාපිත කරන දහමකි.

මිනිසා සහ ඔහුගේ පරමාධිපති අතර පවත්නා සබඳතාවයක් වන සලාතය අතිශ්‍රේෂ්ඨ අංගයකි. එය අතිමහත් නැමදුමකි. එහි දී මිනිසා සිය පරමාධිපති අබියස යටහත් පහත් ව නැගී සිටියි. තමාට කෙසේ විධාන කර ඇත් ද එසේ ඔහු සිය පරමාධිපති ව නමදියි. උතුමාණන්ගේ ශ්‍රේෂ්ඨත්වය හා මහිමය සිහිපත් කරයි. ආදරයෙන් ද බියබැතිමත්භාවයෙන් ද පරම අපේක්ෂාවකින් ද සිය පරමාධිපති කෙරෙන් අයැද සිටියි.

මෙකී සලාතය මහිමයන් හෙවත් ඉමහත් විශිෂ්ටත්ව ගණනාවකින් සමන්විත යි. මෙය ඉස්ලාමීය මූලිකාංග අතුරින් දෙවැන්න වේ. අල්ලාහ් පමණක් පූජනීය වීම සහ මුහම්මද්තුමා දේව දූතයා වීම යන ප්‍රකාශන දෙකින් (ෂහාදා දෙකින්) පසු ව ඇති උත්කෘෂ්ට ක්‍රියාවලිය සලාතය යි. ස්වර්ගයට පිවිසීම සඳහා වන හේතුකාරකවලින් විශිෂ්ට සනයේ ක්‍රියාවලියකි මෙය.

මෙමඟින් අපගේ තත්ත්ව හා තරාතිරම් මහිමාන්විත අල්ලාහ් ඉහළ නංවන්නේය. වැරදි හා පාප මෙමඟින් කමා කරන්නේය. සලාතය ඉටු කිරීම උදෙසා ඇවිද යෑමේ එක් එක් පියවර සඳහා පින් ලියැවෙන්නේය. මුස්ලිම්වරයා මෙකී සලාතය සඳහා උදේ හවස මස්ජිදය කරා යන කල, ස්වර්ගයෙහි ඔහු වෙනුවෙන් ම සත්කාර අනුග්‍රහ සූදානම් කෙරෙන්නේය.

සලාතය කරන්නෙක් සිය නැමදුම් ස්ථානයෙහි සිටින තාක් මලාඉකා හෙවත් සුර දූතයෝ මොහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරති. ඉටු කළා වූ එක් සලාතයක් හා ඉටු කිරීමට නියමිත මීළඟ සලාතය අතරතුර මොහුගෙන් සිදු වන පාපකම්වලට මහිමාන්විත අල්ලාහ් සමාව ප්‍රදානය කරන්නේය. මෙලොව හා පරලොව සලාතය කරන්නාට අත් වන ආලෝකයකි මෙය. අනෙකුත් නැමදුම් වතාවත්වලට ඉහළින් මෙයට උසස් මහිම රැසක් ඇත. මෙය ජිබ්රීල් නම් සුර දූතයා හරහා හෝ මහපොළාවෙහි දී හෝ අනිවාර්ය නොකෙරුණු අතර, මිඃරාජ් නම් අභ්‍යවකාශ ගමන අතරතුර ආකාශයෙහි දී අල්ලාහ් විසින් ඍජු ව මෙම සලාතය දේව දූතයාණන්ට අනිවාර්ය කරන ලද්දක් වීම එකී උසස්භාවය තීව්‍ර කරන මනා සාධකයක් වීමට තරම් ප්‍රමාණවත් ය.

මහිමාන්විත අල්ලාහ් මෙසේ පවසන සේක: (නබි මුහම්මද්,) මෙම ග්‍රන්ථයෙන් (කුර්ආනයෙන්) ඔබ වෙත (වහී ලෙසින්) හෙළිදරව් කරනු ලැබූ දෑ පාරායනා කර පෙන්වන්න. සලාතය ද ස්ථාපිත කරන්න. සැබැවින් ම සලාතය දුරාචාර හා පිළිකුල් සහගත දැයින් වළක් වන්නේය. අල්ලාහ් ව සිහිපත් කිරීම අතිශ්‍රේෂ්ඨ ය. තව ද ඔබලා කරනා දෑ අල්ලාහ් දන්නේය. (අල් අන්කබූත් පරිච්ඡේදය: 45 වැකිය)

දේව දූත මුහම්මද්තුමාණන් පැවසූ බව ජාබිර්තුමා මෙපරිදි වාර්තා කරයි: පංච කාලීන සලාතය වනාහි ඔබ සැමගේ නිවෙස් දොරකඩ අද්දර ගලනා ගැඹුරු ගංගාවක් බඳු ය. එම ගංගාවෙන් ඔහු දිනපතා පස් වතාවක් ස්නානය (කරන්නා සේ සලාතය ඔහු ව පවිත්‍ර) කරයි. (මූලාශ්‍ර ග්‍රන්ථය: මුස්ලිම්)

පටුන

	මාතෘකාව	පිටු අංකය
1	සලාතයෙහි දී පුද්ගලයෙකුගේ හදවතෙහි හා ශරීරාංගවල පවත්නා භක්තිය	9
2	අනිවාර්ය සලාතයන්	13
3	සලාතයට අදාළ ඇතැම් නීතිරීති	15
4	සලාතය ඉටු කළ යුත්තේ කෙසේ ද?	17
5	සලාතය අවලංගු කරවනා දෑ	32
6	සලාතයෙහි දී සිදු නොකළ යුතු නොමනා දෑ	33
7	රෝගියාගේ සලාතය	35
8	මගියාගේ සලාතය	36
9	කාන්තාවකගේ සලාතයෙහි පවත්නා විශේෂ නීතිරීති	37
10	ඇගයීම	40

සලාතයෙහි දී පුද්ගලයෙකුගේ හදවතෙහි හා ශරීරාංගවල පවත්නා භක්තිය

භක්තිය හෙවත් බියබැතිමත්භාවය සලාතයේ ආත්මය වේ. චෛතසික ඒකාග්‍රතාවය, සැහැල්ලුභාවය, අල්ලාහ්ට යටත් වීමේ හැඟීම, සලාතය නොවන දෑ කෙරෙහි මනස චංචල වීමට අවකාශය නොදීම යනාදි දෑ මඟින් මෙකී භක්තිය ඇති වේ. එසේ ම ශරීර අවයව සංසුන්භාවයට පත් වීම, නොසැලකිල්ලෙන් මිදීම, සිටගැනීමේ දී ඇති වන අනවශ්‍ය සෙලවීම් වැනි සලාතයට නුසුදුසු ක්‍රියා ද පෙර කී භක්තිය ආරූඪ කරගැනීම මඟින් පාලනය වේ.

බියබැතිමත්භාවය ඇති කරගැනීමේ විෂයෙහි අනවධානයෙන් සිටීම මඟින් සලාතයෙන් අත් වන කුලිය ද අවම වන්නේය. ඇතැම් විට එය පාපයට ද මුල පුරන්නේය. දේව දූත මුහම්මද්තුමා මෙසේ පැවසුවේය: සලාතය ඉටු කරන ගැත්තාට එයට අයත් කුලියෙන් දහයෙන් එකක්, නවයෙන් එකක්, අටෙන් එකක්, හතෙන් එකක්, හයෙන් එකක්, පහෙන් එකක්, හතරෙන් එකක්, තුනෙන් එකක්, හරි අඩක් පමණ ය ලියැවෙන්නේ. (මූලාශ්‍ර ග්‍රන්ථය: අහ්මද්)

බියබැතිමත්භාවය සාක්ෂාත් කරගැනීමට ඉවහල් වන ඇතැම් සාධකඃ

1. බියබැතිමත්භාවය සාක්ෂාත් කරගැනීම පිණිස මහිමාන්විත අල්ලාහ්ගෙන් අයැද සිටීම.
2. සලාතය කිරීමට මත්තෙන් සිය මනස අනවශ්‍ය යොමු වීම්වලින් තොර කර ගැනීම.
3. සුවඳ විලවුන් ගල්වාගෙන සලාතයට සුදුසු තමන්ට පහසු වස්ත්‍රයක් ඇඳගැනීම.
4. හැකි නම්, නිවසේ සිට ම වුළූඃ දෝවණය කරගැනීම, පරිපූර්ණ හා නිසි ලෙස එය සිදු කිරීම.
5. අප්‍රසන්න දුගඳ හමනා දෑවලින් ඈත් වීම හා එවන් ජුගුප්සාජනක දෑ සිය ඇඳුම්වලින් ද මුඛයෙන් ද ඉවත් කරගැනීම.
6. සලාතය ඉටු කරන වේලාවෙහි දී ආහාර ගැනීමට සූදානමක් වේ නම්, ආහාර අනුභවය මුලින් කළ යුතු වේ. මන්ද සලාතයෙහි නිරත වන කල සිය මනස ආහාර කෙරෙහි යොමු වීමට හැකි ය.

7 මල මුත්‍ර පහ කිරීමේ දැඩි අවශ්‍යතාවය මත සලාතය නොකර සිටීම. ඇරත්, එම ශරීර කෘත්‍ය සලාතයට පූර්වයෙන් අවසන් කිරීම මඟින් බියබැතිමත්භාවයට හා සන්සුන්භාවයට හානියක් සිදු නොවේ.

8 මස්ජිදයට සක්මන් කර යෑමේ දී ශාන්ත අන්දමින් ද ගෞරවනීය අන්දමින් ද යෑම. සාමූහික සලාතය පැවැත්වෙමින් තිබුණ ද ඒ කරා දිව යෑම නොකළ යුතු ය. මන්ද, කලබල වීම හරහා මානසික ඒකාග්‍රතාවය බිඳ වැටේ.

9 නිවසින් පිටවීමේ දී, මස්ජිදයට යන අතරතුර දී, මස්ජිදයට ඇතුළු වන විට දී ධාර්මික පිළිවෙතින් නිශ්චිත කරන ලද අවස්ථානුකූල ප්‍රාර්ථනා හා සිහිපත් කිරීම් සමුදීරණය කිරීම.

10 මස්ජිදයට ඇතුළු වීම උදෙසා කරන රක්ආත් දෙකකින් සමන්විත තහිය්යතුල් මස්ජිද් සලාතය ඉෂ්ට කිරීම. අනිවාර්ය නොවන දේව දූත සම්ප්‍රදා සලාතයට (සුන්නත් සලාතයට) අයත් කුලිය මෙයට හිමි වේ.

11 සාමූහික සලාතය ස්ථාපිත කිරීමේ ඉකාමත් නම් නිවේදන ප්‍රකාශය පවසනා තුරු උත්තරීතර අල්ලාහ් ව සිහිපත් කරමින් සිටීම. ලෞකික කටයුතු සම්බන්ධයෙන් සලාතය උදෙසා පැමිණි අනෙකුත් උදවිය හා කතා කිරීමෙන් වැළකීම.

අනිවාර්ය සලාතයන්ඃ

උත්තරීතර අල්ලාහ් මුස්ලිම්වරුන් කෙරෙහි උදේ හවස ඉටු කිරීම පිණිස පංච කාලීන සලාතයන් අනිවාර්ය කර ඇත. ඉස්ලාමීය ශික්ෂා සංග්‍රහයෙන් නියම කෙරුණු නිශ්චිත වේලාවන්වල එකී සලාතය සිදු විය යුතු යි. ඒවා අනුපිළිවෙළින්ඃ ෆජ්ර්, ළුහ්ර්, අස්ර්, මග්රිබ්, ඉෂාඃ යන සලාතයන් වේ. පෙර කී සෑම සලාතයකට ම එයට ම නිශ්චිත රක්ආත් ගණනක් තිබෙන අතර ඉන් තොර එය නිරවද්‍ය නොවේ. එසේ ම එක් එක් ඒවාට එයට ම නිශ්චිත එය ඉටු කළ යුතු වේලාවක් ද ඇත. එම වේලාවන්වලට අදාළ කාලගුණික සංකේත දේව දූත සම්ප්‍රදා හෙවත් හදීස් මඟින් දැනගත හැකි වන අතර සම්මත ඔරලෝසු වේලාවලින් හෝ සලාතය උදෙසා ඇරයුම් කරන මුස්ලිම්වරුන්ගේ අZසාන් නම් කැඳවුම හරහා හෝ දැනගත හැකි ය.

සලාතයට අදාළ ඇතැම් නීතිරීති:

1. මුස්ලිම්වරයෙකු කුමන පාපයක නිරත වුව ද සලාතය අත හැරීමට ඔහුට අවසර නැත. මන්ද, සලාතය මුළුමනින් ම නොකර අතහරින්නා මුස්ලිම්වරයෙක් නොවේ.

2. පිරිමි උදවිය මස්ජිදයෙහි සාමූහික වශයෙන් සලාතය ඉටු කිරීම මූලික කරුණකි. තනි ව තමා පමණක් සලාතය ඉටු කිරීමට වඩා සාමූහික සලාතය අතිශ්‍රේෂ්ඨ යි. නිවස, මාර්ගය හෝ එළිමහන් භූමිය වැනි කුමන හෝ පවිත්‍ර ස්ථානයක සලාතය ඉටු කිරීම වලංගු වේ.

3. මුස්ලිම්වරයා සිය අව්රතය හෙවත් අනිවාර්යයෙන් වැසිය යුතු ශරීර පෙදෙස් ආවරණය කළ යුතු යි. පිරිසිදු තත්ත්වයකින් සලාතයට ප්‍රවිශ්ට විය යුතු යි. වුළූඃ දෝවණය සිදු කිරීම පිළිබඳ නිසි අවබෝධය නොමැති නම් එබව නිසි ලෙස උගත යුතු යි.

4. සලාතය කරන්නා ඉමාම්වරයෙක් (සලාතය මෙහෙවන්නෙක්) හෝ තනි ව ඉටුකරන්නෙක් වන්නේ නම්, ඔහු තමන් ඉදිරියේ යම් කිසි මායිම් බාධකයක් තබා ගැනීම ඉතා හොඳ ය. එනම්, තමා ඉදිරියේ පසු කර යන්නන් හරහා සිය සලාතයට බාධාවක් ඇති නොවනු පිණිස තමන්ගේ සලාතය ඉටු කරන පෙදෙස මායිම් කරන (ගලක්, රිටක්, ලෑල්ලක් වැනි තැනට සුදුසු) යම් බාධයක් තැබීම වේ.

අතිරේක එලදායී කරුණක්: පවිත්‍රතාවය සම්පූර්ණ වන්නේ වුළූඃ දෝවණය මඟින් ද, ශාරීරික හා නැමදුම් ස්ථානය අපවිත්‍රවලින් පිරිසිදු වීම මඟින් ද ය.

අතිරේක එලදායී කරුණක්: සලාතය වලංගු වීම හෙවත් නිවැරැදි වීම පිණිස ඇතැම් කොන්දේසි ඇත. ඒවා නම්; පිරිසිදුකම, චේතනාව, කිබ්ලාව නම් සලාතය සඳහා පෙරටු කළ යුතු දිශාව, සලාතයට නියමිත වේලාව උදා වී තිබීම යනාදිය යි.

සලාතය ඉටු කළ යුත්තේ කෙසේ ද?

සලාතය ඉටු කරනාකාරය ගැන ප්‍රායෝගික හා රූපිත විග්‍රහයක්

රක්ආත් සතරකින් සමන්විත සලාතය ඉටු කරන්නේ කෙසේ ද?

ලුහ්ර්, අස්ර්, ඉෂාඃ යන සලාතයන් ඉටු කරනාකාරය ගැන රූපිත විග්‍රහයක්

1 **කිබ්ලා දෙසට මුහුණ ලා සිටීම:** එය මක්කා දිශාව යි. ඉතා නිවැරැදි ව (තිතට ම) කඃබාවට මුහුණ ලා සිටීම කොන්දේසියක් නොවන අතර පොදුවේ එය පිහිටා ඇති දිශාවට මුහුණ ලා සිටිය යුතු යි.

2 **චේතනාව:** මුවින් ප්‍රකාශ නොකර හදවතින් චේතනා කර ගත යුතු යි. එනම් නියමිත වේලාවට අදාළ සලාතය ඉටු කරනා බව හදවතින් සිතාගත යුතු යි.

3 **පළමු තක්බීරය:**

අ) සිය උරහිස් දෙක දක්වා හෝ සිය දෙකන් දක්වා අපගේ දෑත් එසවීම, අපගේ දෙඅල්ල කිබ්ලාවට මුහුණ ලා තබා ගැනීම, එකල ම අල්ලාහු අක්බර් යැයි පැවසීම. මුවින් මෙසේ ප්‍රකාශ කිරීම අනිවාර්ය වේ.

ආ) ප්‍රථම තක්බීරයෙන් පසු වමතට උඩින් දකුණත තබා ගැනීම සුන්නත් හෙවත් දේව දූත සම්ප්‍රදායකි. එපරිදි දෑත් පපුව මත හෝ පෙකණියට ඉහළින් හෝ තමාට පහසු අයුරින් තබා ගැනේ.

ඇ) සුජූද් හෙවත් නළල තබනා ස්ථානය දෙස දෑස් යොමු කළ යුතු යි. සිය බැල්ම අහස දෙසට එසවීම, ඔබමොබ බැලීම හෝ නොකළ යුතු යි.



මෙම QR කෝඩ් හෙවත් QR කේතය ස්කෑන් කර සලාතය ඉටු කරනාකාරයට අදාළ දැනුම්වත් කිරීමේ පරිපූර්ණ තොරතුරු දැක බලාගන්න.

4 සලාතයට ප්‍රවේශ වීමේ ප්‍රාර්ථනාව: මෙම ප්‍රවේශයට අයත් එක් ප්‍රාර්ථනාවක් පහත සේ ය: (සැලකිය යුතු යි: අරාබි අක්ෂර උච්චාරණවලින් සිංහල අක්ෂර උච්චාරණ වෙනස් වේ. අරාබි භාෂා උච්චාරණ හැදෑරීමට උත්සුක වීම එම පාඨවලට නිවැරැදි අදහස වෙනස් නොවීමට ඉවහල් වේ.)

"අල්ලාහුම්ම බාඉද් බයිනී වබයින කතායාය කමා බාඅද්ත බයිනල් මෂ්රිකි වල්මග්රිබ්, අල්ලාහුම්ම නක්කිනී මින් කතායාය කමා යුනක්කස් සව්බුල් අබ්යලු මිනද් දනස්, අල්ලාහුම්ම ඉග්සිල්නී මින් කතායාය බිස්සල්ජි වල්මාඉ වල්බරද්."

සිංහල අදහස: "දෙවිඳාණනි, නැගෙනහිර හා බටහිර අතර ඔබ ඇති කළා වූ දුර සේ මා හා මාගේ පාපයන් අතර ද දුරස්ථභාවය ඇති කරනු මැනවි! දෙවිඳාණනි, සුදෝසුදු වස්ත්‍රයක් කිලුටුවලින් පවිත්‍ර කරන්නා සේ මාගේ පාපයන්ගෙන් මා පවිත්‍ර කරනු මැනවි! දෙවිඳාණනි, හිම කැට ද ජලය ද පිනි බිඳු ද යොදා මාගේ පාපවලින් මා සෝදා හරිනු මැනවි!"

5 ආරක්ෂාව පැතීම: "අඌzසු බිල්ලාහි මිනෂ් ෂයිතානිර් රජීම්."

සිංහල අදහස: "ශාපලත් ෂයිතාන්ගේ උවදුරුවලින් අල්ලාහ්ගෙන් මම ආරක්ෂාව පතමි."

6 අල් ෆාතිහා පරිච්ඡේදය කියවීම: භක්තියෙන් හා සන්සුන් ව අල් ෆාතිහා පරිච්ඡේදය වැකියක් වැකියක් ලෙසින් කියවීම. මෙම පරිච්ඡේදය අතිශ්‍රේෂ්ඨ ප්‍රාර්ථනාවලින් සමන්විත යි. එහෙයින්, මෙය කියවා අවසන් කළ පසු "ආමීන්" යැයි පැවසිය යුතු වේ. එහි අදහස නම්, ඉහත කියැවූ පරිච්ඡේදයෙහි ඇතුළත් ප්‍රාර්ථනා "පිළිගනු මැනවි" යැයි දෙවිඳාණන්ගෙන් අයැදීම යි. මෙම පදය අල් ෆාතිහා පරිච්ඡේදයේ වැකියක් නොවේ.

7 තමන්ට පහසු යමක් උතුම් කුර්ආනයෙන් කියවීම: අල් ෆාතිහා පරිච්ඡේදය කියවා අවසන් කළ පසු වෙනත් සම්පූර්ණ පරිච්ඡේදයක් හෝ ඉන් කොටසක් කියවීම.

8 රුකූඃ කිරීම

අ) සිය උරහිස් දෙක දක්වා හෝ සිය දෙකන් දක්වා අපගේ දෑත් ඔසවා “අල්ලාහු අක්බර්” යැයි පැවසීම. එසැණ අප සෘජු ව සිටගත් ඉරියව්වේ සිට රුකූඃ ඉරියව්වට මාරු විය යුතු යි.

ආ) දෙඅල්ල සිය දණිස් දෙක මත තබා ගත යුතු යි. අතැඟිලි හොඳින් විහිදුවා දණිස් දෙක අල්ලාගන්නා සේ තබා ගත යුතු වේ.

ඇ) රුකූඃ ඉරියව්වෙහි ඉතා සන්සුන් ව සිටිය යුතු වේ. පිට කොන්ද දුන්නක් සේ නොනමා සමාන්තර ව තබා ගත යුතු යි. හිස ද පිට කොන්දට සමාන්තරව තබා ගනිමින් හිස එසවීමක් හෝ පහත් කිරීමක් නොකළ යුතු වේ.

ඈ) ඉළ ඇට දෙපස හෙවත් පපු දෙපසට සිය දෑත් එක් නොකර ඉන් ඈත් කර තබා ගත යුතු අතර සිය දෙකම්මුල් දෙපැත්තට නොහරවා කෙළින් තබා ගත යුතු යි.

ඉ) එවිට “සුබ්හාන රබ්බියල් අළීම්” (සිංහල අදහසඃ අත්‍යුත්කෘෂ්ට මාගේ පරමාධිපති ව සුවිශුද්ධ කරමි) යැයි තෙවරක් පැවසිය යුතු යි. තෙවරක් පැවසීම පූර්ණත්වයේ අවම ප්‍රමාණය යි. කැමති නම් වැඩි කරගත හැකි ය. එක් වතාවක් පැවසීම වුව ද අවසර ය. මේ හැර රුකූඃ ඉරියව්වෙහි පැවසිය යුතු තවත් බොහෝමයක් ප්‍රාර්ථනා හා සිහිපත් කිරීම් ඇත.

9 **රුකූඃ ඉරියව්වේ සිට ඉහළට එසවීම.** සිය හිස රුකූඃ ඉරියව්වේ සිට ඉහළට එසවීම මින් අදහස් කෙරේ. එකල, සිය උරහිස් දෙක දක්වා හෝ සිය දෙකන් දක්වා අපගේ දෑත් එසවීමත් සමඟ ම තනි ව සලාතය කරන්නෙක් හෝ සලාතය මෙහෙය වන ඉමාම්වරයෙක් වන්නේ නම්, “සමිඅල්ලාහු ලිමන් හමිදහ්” (සිංහල අදහස: අල්ලාහ් ව ප්‍රශංසාවට ලක් කරනු උතුමාණෝ සවන් දුන්හ) යැයි පැවසිය යුතු වේ.

රුකූඃ ඉරියව්වේ සිට සෘජු ව සිටගත් පසු අපගේ දෑත් පහළට දැමිය හැකි සේ ම තක්බීර්හි දී සේ දෑත් බැඳගැනීමට ද හැකි ය.

10 **රුකූඃ ඉරියව්වේ සිට සෘජු ව සිටගන්නා ඉරියව්වට පැමිණීම. සෘජු ව සිට ගනිමින් මෙසේ පැවසිය යුතු වේ.** “රබ්බනා වලකල් හම්ද්” (සිංහල අදහස: අපගේ පරමාධිපතියාණනි, ඔබට ම ය සියලු පැසසුම් හිමි වන්නේ). මෙම ඉරියව්වෙහි මඳක් කල් අරගෙන සන්සුන් ව සිටීම සුන්නත් හෙවත් දේව දූත සම්ප්‍රදායකි.

11 සුජූද්

අ "අල්ලාහු අක්බර්" යැයි තක්බීර් පවසමින් පහතට නැමිය යුතු යි.

ආ සිය දණිස් දෙක පොළොව මත තැබීමට මත්තෙන් සිය දෙඅල්ල පොළොවේ තැබිය යුතු යි. නැතහොත් දණිස් දෙක දෙඅල්ල තැබීමට මත්තෙන් තැබිය යුතු වේ. තමාට කුමක් පහසු ද ඉන් එක් ක්‍රමයක් පිළිපැදිය යුතු වේ.

ඇ අවයව හතක් මෙම සුජූද් ඉරියව්වේ දී මහ පොළොව මත පතිත වේ.



- මින් කිසිදු අවයවයක් නිසි ලෙස පතිත නොකර නොසැලකිල්ලෙන් සිටිය නොයුතු යි.

ඇ) දෙඅත් ඇඟිලි එක් කොට කිබ්ලා දිශාවට මුහුණ ලා තබා ගත යුතු යි. උරහිස් දෙකට හෝ දෙකන්වලට කෙළින් සිටින සේ දෙඅල්ල පොළොව මත තබා ගත යුතු යි. මැණික් කටුවේ සිට වැලමිට දක්වා ඇති දෑත් පෙදෙස පොළොවට නොඅලවා උස් කර තබා ගත යුතු යි.

ඉ) මැණික් කටුවේ සිට වැලමිට දක්වා ඇති දෑත් පෙදෙස පපු දෙපසට එක් නොකළ යුතු යි. එකල, සාමූහික සලාතය ඉටු කරන්නේ නම්, එසේ දෑත් ඈත් කිරීම මඟින් ළඟ සිටින බැතිමතාට අවහිරයක් හෝ අපහසුතාවයක් ඇති නොවීමට වග බලා ගත යුතු වේ.

ඊ) සිය දෙපාවල ඇඟිලි තුඩු කිබ්ලාව දෙසට නමා ගත යුතු වේ. එමඟින් දෙපා පොළොවට ඇන තියාගත හැකි ය. කලවා දෙක ද එකිනෙකට එක් නොකර ඈත් කර තබාගත යුතු වේ.

උ) එවිට “සුබ්හාන රබ්බියල් අඃලා” (සිංහල අදහස: උත්තරීතර මාගේ පරමාධිපති ව සුවිශුද්ධ කරමි) යැයි තෙවරක් පැවසිය යුතු යි. තෙවරක් පැවසීම පූර්ණත්වයේ අවම ප්‍රමාණය යි. කැමති නම් වැඩි කරගත හැකි ය. එක් වතාවක් පැවසීම වුව ද අවසර ය. මීට අමතර ව ඇති සුජූද් ඉරියව්වෙහි පැවසිය යුතු බොහෝමයක් ප්‍රාර්ථනා හා සිහිපත් කිරීම් එක් එක් සුජූද් අවස්ථාවල ප්‍රකාශ කිරීම වඩා හොඳ ය.

ඌ) තමාට කැමති ප්‍රාර්ථනාවක්, කන්නලව්වක් මෙලොව පරලොව සුබසිද්ධිය උදෙසා අයැදිය හැකි ය.

12 **සුජූද් ඉරියව්වෙන් එසවීම:** “අල්ලාහු අක්බර්” යැයි පවසමින් අපගේ හිස සුජූද් ඉරියව්වෙන් එසවිය යුතු යි. සුජූද් දෙකක් අතර හිඳුම මින් සිදු වේ.

13 සුජූද් දෙකක් අතර හිඳගැනීම:

අ) වම් කකුල පොළොවට පතිත වන සේ තබා, ඒ මත සන්සුන් ව වාඩි විය යුතු වේ. දකුණු කකුල පොළොවට ඇන තියාගෙන දකුණු පාදයේ ඇඟිලි කිබ්ලාව දෙසට නමා තබා ගත යුතු යි. නැතහොත් පාද දෙක ම ඇන තියාගෙන දෙපා විළුඹ දෙක මත වාඩි විය යුතු යි.

ආ) දෑතේ දකුණත් ඉදිරිපස කොටස දකුණු කලවා මත ද, වමත් ඉදිරිපස කොටස වම් කලවා මත ද දණහිසට අසලින් හෝ දණහිසට උඩින් තබා ගත යුතු ය.

ඇ) එවිට "රබ්බිග්ෆිර් ලී, රබ්බිග්ෆිර් ලී" යනුවෙන් ප්‍රකාශ කළ යුතු යි.

14 සුජූද් ඉරියව්ව:

"අල්ලාහු අක්බර්" යැයි පවසමින් දෙවන සුජූද් සඳහා සිරස පහත් කරමින් සතඟ පතිත කළ යුතු යි. පෙර සඳහන් පළමු සුජූද් සිදු කළ අයුරින් ම මෙය ද සිදු කළ යුතු වේ.

15 සුජූද් ඉරියව්වෙන් නැගිටීම:

"අල්ලාහු අක්බර්" යැයි පවසමින් සුජූද් ඉරියව්වෙන් සිටගන්නා ඉරියව්වට මාරු විය යුතු යි.

16 දෙවන රක්ආතය ඉටු කිරීම· පළමු රක්ආතය ඉටු කළා සේ ම දෙවන රක්ආතය ද ඉටු කළ යුතු වේ·

- පපුව මත දෑත් තැබීම, අල් ෆාතිහා පරිච්ඡේදය කියවීම, තවත් සම්පූර්ණ පරිච්ඡේදයක් හෝ ඉන් කොටසක් කියවීම.
- පසු ව, තක්බීර් පැවසීම, රුකූඃ කිරීම, එහි දී දෙවිඳාණන් ව සුවිශුද්ධ කිරීම.
- පසු ව, රුකූඃ ඉරියව්වෙන් සිටගැනීමට හිස ඔසවමින්· “සමිඅල්ලාහු ලිමන් හමිදහ්” යැයි පැවසීම.
- පසු ව, ඍජු ව සිටගනිමින් “රබ්බනා වලකල් හම්ද්” යැයි පැවසීම.
- පසු ව, තක්බීර් පවසමින් සුජූද් කිරීම සඳහා පහත් වීම, සුජූද් ඉරියව්වෙහි දෙවිඳාණන් ව සුවිශුද්ධ කිරීම.
- පසු ව, තක්බීර් පවසමින් සුජූද් දෙක අතර ඇති මැද හිඳුමෙහි වාඩි වීම. එහි දී “රබ්බිග්ෆිර් ලී, රබ්බිග්ෆිර් ලී” යනුවෙන් පැවසීම.
- පසු ව, තක්බීර් පවසමින් දෙවන සුජූද් කිරීම හා එහි දී දෙවිඳාණන් ව සුවිශුද්ධ කිරීම.

17 පළමු තෂහ්හුද්

අ දෙවන රක්ආතයේ දෙවන සුජූද් ඉරියව්වේ සිට “අල්ලාහු අක්බර්” යැයි පවසමින් අපගේ හිස සුජූද් ඉරියව්වෙන් එසවිය යුතු යි. සුජූද් දෙක අතර මැද හිඳුමේ වාඩි වූ ආකාරයෙන් ම පළමු තෂහ්හුද්හි දී ද වාඩි විය යුතු යි.

ආ දකුණත දකුණු කලවා මත තබමින් දබරැඟිල්ල හැර දකුණත මිට මොළවා ගත යුතු වේ. සංඥා කරන්නාක් සේ දබරැඟිල්ල කිබ්ලාව දෙසට දික් කරගත යුතු යි. නැතිනම්, මහපට ඇඟිල්ල හා මැද ඇඟිල්ල ඇතුළු අනෙකුත් ඇඟිලි එකට එක් කොට වළල්ලක් සේ රවුම් කර, දබරැඟිල්ල සංඥා කරන්නාක් සේ තබාගත යුතු වේ. වමත වූ කලී, වම් කලවා මත වමත් ඇඟිලි විහිදුවා තබා ගනිමින් හෝ වම් දණහිස අල්වා ගනිමින් හෝ තබාගත හැකි ය.

ඇ මෙම තෂහ්හුද් අවස්ථාවේ සිය දබරැඟිල්ල දෙස නෙත් යොමු කළ යුතු යි.

ඈ එවිට තෂහ්හුද් පැවසිය යුතු යි. එය නම්: “අත්තහිය්යාතු ලිල්ලාහි වස්සලවාතු වත්තයිබාතු, අස්සලාමු අලයික අය්යුහන් නබිය්යු වරහ්මතුල්ලාහි වබරකාතුහූ, අස්සලාමු අලයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන්, අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහූ වරසූලුහූ”

සිංහල අදහස: “උත්තුංග ගුණ වර්ණනා, නැමදුම්, සියලු යහකම් යනාදිය හිමි වන්නේ අල්ලාහ්ට පමණි. නබිවරයාණනි, ඔබ කෙරෙහි ශාන්තිය අත් වේවා! අල්ලාහ්ගේ කරුණාව සහ අභිවෘද්ධිය ද ඔබ කෙරෙහි උදා වේවා! අප කෙරෙහි ද, අල්ලාහ්ගේ සැදැහැවත් ගැත්තන් කෙරෙහි ද ශාන්තිය අත් වේවා! අල්ලාහ් හැර නැමදුම් ලැබුමට සුදුසු වෙනත් දෙවියෙකු නැති බව මම සාක්ෂි දරමි. එලෙස ම, මුහම්මද්තුමා අල්ලාහ්ගේ ගැත්තා ද දූතයා ද වන බව මම සාක්ෂි දරමි.”

18 **තෂහ්හුද් ඉරියව්වෙන් නැගිට සිටීම:** තුන්වන රක්ආතය සඳහා සිටගැනීම. සිය උරහිස් දෙක දක්වා හෝ සිය දෙකන් දක්වා අපගේ දෑත් ඔසවා "අල්ලාහු අක්බර්" යැයි පවසා දෙඅත් පපුව මත තබා ගනිමින් පළමු රක්ආතය ඉටු කරනාකාරය විස්තර කෙරුණු අයුරින් මෙම රක්ආතය ද ඉටු කළ යුතු නමුත් මෙහි දී අල් ෆාතිහා පරිච්ඡේදය පමණක් කියවිය යුතු යි.

- **පපුව මත දෑත් තැබීම, අල් ෆාතිහා පරිච්ඡේදය කියවීම.**
- **පසු ව, තක්බීර් පැවසීම, රුකූඃ කිරීම, එහි දී දෙවිඳාණන් ව සුවිශුද්ධ කිරීම.**
- **පසු ව, රුකූඃ ඉරියව්වෙන් සිටගැනීමට හිස ඔසවමින්: "සමිඅල්ලාහු ලිමන් හමිදහ්" යැයි පැවසීම.**
- **පසු ව, ඍජු ව සිටගනිමින් "රබ්බනා වලකල් හම්ද්" යැයි පැවසීම.**
- **පසු ව, තක්බීර් පවසමින් සුජූද් කිරීම සඳහා පහත් වීම, සුජූද් ඉරියව්වෙහි දෙවිඳාණන් ව සුවිශුද්ධ කිරීම.**
- **පසු ව, තක්බීර් පවසමින් සුජූද් දෙක අතර ඇති මැද හිඳුමෙහි වාඩි වීම. එහි දී "රබ්බිග්ෆිර් ලී, රබ්බිග්ෆිර් ලී" යනුවෙන් පැවසීම.**

19 **සුජූද් ඉරියව්වේ සිට "අල්ලාහු අක්බර්" යැයි පවසමින් සිටගන්නා ඉරියව්වට පැමිණීම:** දෙවන රක්ආතය ඉටු කළ අයුරින් ම මෙම සතරවන රක්ආතය ද ඉටු කළ යුතු නමුත් මෙහි දී ද අල් ෆාතිහා පරිච්ඡේදය පමණක් කියවිය යුතු වේ.

- **පපුව මත දෑත් තැබීම, අල් ෆාතිහා පරිච්ඡේදය කියවීම.**
- **පසු ව, තක්බීර් පැවසීම, රුකූඃ කිරීම, එහි දී දෙවිඳාණන් ව සුවිශුද්ධ කිරීම.**
- **පසු ව, රුකූඃ ඉරියව්වෙන් සිටගැනීමට හිස ඔසවමින්: "සමිඅල්ලාහු ලිමන් හමිදහ්" යැයි පැවසීම.**
- **පසු ව, ඍජු ව සිටගනිමින් "රබ්බනා වලකල් හම්ද්" යැයි පැවසීම.**
- **පසු ව, තක්බීර් පවසමින් සුජූද් කිරීම සඳහා පහත් වීම, සුජූද් ඉරියව්වෙහි දෙවිඳාණන් ව සුවිශුද්ධ කිරීම.**
- **පසු ව, තක්බීර් පවසමින් සුජූද් දෙක අතර ඇති මැද හිඳුමෙහි වාඩි වීම. එහි දී "රබ්බිග්ෆිර් ලී, රබ්බිග්ෆිර් ලී" යනුවෙන් පැවසීම.**

20 **අවසාන තෂහ්හුද්:**

අ "අල්ලාහු අක්බර්" යැයි පවසමින් සුජූද් ඉරියව්වේ සිට එසවී තෂහ්හුද් සඳහා වාඩි විය යුතු යි.

ආ තට්ටම බිම තබා වාඩි වීම; එනම්, වම් තට්ටම බිම පතිත වන සේ වාඩි වෙමින් පළමු තෂහ්හුද්හි සිටියා සේ දකුණු කකුල ඇන තියාගත යුතු යි. වම් කකුල දකුණු කකුලට පහළින් එළියට එන සේ තබා ගත යුතු වේ.

ඉ "අත්තහියියාතු ලිල්ලාහි..." යන පළමු තෂහ්හුද්හි කියැවූ වාග්පෙළ මුළුමනින් ම පවසා, පසු ව අස් සලාතුල් ඉබ්රාහිමියියා නමැති පහත සඳහන් ප්‍රාර්ථනාව ද කියවිය යුතු වේ. "අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මද්, කමා සල්ලයිත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම, ඉන්නක හමීදුන් මජීද්, අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මද්, කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම, ඉන්නක හමීදුන් මජීද්."

සිංහල අදහස: "දෙවිඳාණනි, ඉබ්‍රාහීම්තුමා කෙරෙහි ද එතුමාගේ පවුල කෙරෙහි ද ඔබ ආශිර්වාද කළා සේ මුහම්මද්තුමා කෙරෙහි ද එතුමාගේ පවුල කෙරෙහි ද ඔබ ආශිර්වාද කරනු මැනව! සැබැවින් ම ඔබ ම ය සර්ව පැසසුමට හා කීර්තියට හිමිකරු වන්නේ. දෙවිඳාණනි, ඉබ්‍රාහීම්තුමා කෙරෙහි ද එතුමාගේ පවුල කෙරෙහි ද ඔබ අභිවෘද්ධිය ඇති කළා සේ මුහම්මද්තුමා කෙරෙහි ද එතුමාගේ පවුල කෙරෙහි ද ඔබ අභිවෘද්ධිය ඇති කරනු මැනව! සැබැවින් ම ඔබ ම ය සර්ව පැසසුමට හා කීර්තියට හිමිකරු වන්නේ."

පසු ව, තමන්ට පහසු හදීස් හෙවත් දේව දූත සම්ප්‍රදාවල සඳහන් ප්‍රාර්ථනාවක් පැවසීම දේව දූත සම්ප්‍රදායකි. නිදසුනක් ලෙස: "අල්ලාහුම්ම ඉන්නී අඌzසු බික මින් අzසාබි ජහන්නම, වමින් අzසාබිල් කබ්ර්, වමින් ෆිත්නතිල් මහ්යා වල්මමාති, වමින් ෂර්රි ෆිත්නතිල් මසීහිද් දජ්ජාල්."

සිංහල අදහස: "දෙවිඳාණනි, නිරයේ වේදනාවෙන් ද කබ්රයේ (මිනී වළේ) වේදනාවෙන් ද මම ඔබගෙන් ආරක්ෂාව පතමි. ජීවිතයේ හා මරණයේ සිදුවන අයහපත් පිරික්සුම්වලින් ද, විනාශකාරී දජ්ජාල්ගේ උවදුරුවලින් ද මම ඔබගෙන් ආරක්ෂාව පතමි."

එලෙස ම, මෙලොව පරලොව සුබ සිද්ධිය උදෙසා තමන්ට කැමති ප්‍රාර්ථනාවක් අයැදිය හැකි ය.

21 **අත් තස්ලීම්:** "අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහ්" යැයි පවසමින් අපගේ මුහුණ දකුණු පැත්තට හැරවිය යුතු යි. පසු ව, නැවතත් "අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහ්" යැයි පවසමින් අපගේ මුහුණ වම් පැත්තට හැරවිය යුතු යි. මෙමඟින් අපගේ සලාතය අවසන් වන්නේය.

22 **සලාතය කරන්නා සලාම් හෙවත් "අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහ්" යැයි පවසා සලාතය අවසන් කළ පසු මඳක් එතැන රැඳී සිටීම දේව දූත සම්ප්‍රදාය හෙවත් සුන්නාවකි.** තෙවරක් "අස්තග්ෆිරුල්ලාහ්" යැයි පවසමින් මහිමාන්විත අල්ලාහ්ගෙන් පව් සමාව අයැදිය යුතු යි. පසු ව, දේව දූතයාණන් අපට උගන්වා ඇති අනෙකුත් සිහිපත් කිරීම් හරහා සුවිශුද්ධවන්තයාණන් වන උත්තරීතර අල්ලාහ් ව සිහිපත් කිරීම සුන්නාවකි.

රක්ආත් දෙකකින් හා රක්ආත් තුනකින් සමන්විත සලාතය ඉටු කරන්නේ කෙසේ ද?

අ ෆජ්ර් සලාතය මෙන් රක්ආත් දෙකකින් සමන්විත සලාතයක් නම්, දෙවන රක්ආතයේ සුජූද් දෙකින් පසු තෂහ්හුද් සඳහා වාඩි විය යුතු යි. එහි දී: “අත්තහියිය්යාතු ලිල්ලාහි...” යන වාග්පෙළ මුළුමනින් ම පවසා පසු ව, අස්ලාතුල් ඉබ්රාහීමිය්යා ද පවසා සලාම් කියමින් සලාතය අවසන් කළ යුතු වේ.

ආ මග්රිබ් සලාතය මෙන් රක්ආත් තුනක සලාතයක් නම්, තුන්වන රක්ආතයේ සුජූද් දෙකින් පසු තෂහ්හුද් සඳහා වාඩි විය යුතු යි. එහි දී: “අත්තහියිය්යාතු ලිල්ලාහි...” යන වාග්පෙළ මුළුමනින් ම පවසා පසු ව, අස්ලාතුල් ඉබ්රාහීමිය්යා ද පවසා සලාම් කියමින් සලාතය අවසන් කළ යුතු වේ.

සැලකිය යුතු යි.

1. තෂහ්හුද්හි වම් කකුල මත වාඩි වීම රක්ආත් දෙකකින් සමන්විත ෆජ්ර්, ජුමුආ, ඊදුල් ෆිත්ර්, ඊදුල් අල්හා වැනි සලාතයන්වල සිදු වේ. එලෙස ම රක්ආත් තුනකින් සහ හතරකින් සමන්විත සලාතයන්වල පළමු තෂහ්හුද්හි දී ද, සුජූද් දෙක අතර පවතින මැද හිඳුමෙහි දී ද සිදු වේ.

2. තට්ටම මත වාඩි වීම රක්ආත් හතරකින් හා රක්ආත් තුනකින් සමන්විත සලාතයන්වල අවසාන තෂහ්හුද්හි දී සිදු වේ.

3. ශාරීරික තරබාරුකම හේතුවෙන් හෝ පාදයේ යම් ආබාධයක් හේතුවෙන් හෝ වෙනත් යම් සාධාරණ හේතුවක් මත හෝ කෙනෙකුට ඉහත කී ආකාර දෙකින් වාඩි වීමට නොහැකි නම් එහි වරදක් නොමැත. එවැන්නෙකුට තමාට පහසු අයුරකින් වාඩි විය හැකි ය.

සලාතය අවලංගු කරවන දෑ

1- සලාතය පිළිගනු ලැබීමට අදාළ කොන්දේසිවලින් එකක් හෝ එය ඉටුකිරීමට සම්පූර්ණ හැකියාව පවතින අවස්ථාවක එය ඉටු නොකර සිටීම.

2- සලාතයේ මූලිකාංග වුවමනාවෙන් හෝ අමතක වීමකින් අතහැරීම. (උදා: හැකියාව ඇත්තෙකු සිටගැනීම, පළමු තක්බීරය, අල් ෆාතිහා පරිච්ඡේදය කියවීම, රුකූඃ සහ සුජූද් කිරීම...)

3- සලාතයේ අනිවාර්ය අංගයක් වුවමනාවෙන් අතහැරීම. (උදා: පළමු තක්බීර් නොවන අනෙකුත් තක්බීර්, සමිඅල්ලාහු ලිමන් හමිදහ් පැවසීම, රුකූඃ හා සුජූද්වලට අදාළ සිහිපත් කිරීම් කියවීම, පළමු තෂහ්හුද්...)

4- අධික චලනය, කතා කිරීම, අත්‍යවශ්‍ය හේතුවක් රහිත ව වුවමනාවෙන් ම ඇවිද යෑම.

5- සිනාසීම, කොක්හඬ ලා සිනාසීම

6- වුවමනාවෙන් කෑම හෝ බීම

සලාතයෙහි දී අමතකවීමකින් සිදුවන දෝෂ සඳහා ඇති නීති ගැන මුස්ලිම්වරයා දැනගැනීම වඩා වැදගත් වේ.

සලාතයෙහි දී සිදු නොකළ යුතු නොමනා දෑ (මක්රූහ්)·

සලාතය අවලංගු නොකරන නමුත් ඒවා කිරීම අප්‍රසන්න හෝ පිළිකුල් ලෙස සැලකෙන ඇතැම් ක්‍රියා ඇත. එවන් දෑ සලාතය කරන්නා නොකළ යුතු වේ. ඒවා නම්;

1- සලාතය අතරතුර මුහුණ හැරවීම.

2- ශාරීරික අවයවවලින් අනවශ්‍ය ක්‍රියාවල නියැළීම, ඇඟිලි ඇට කැඩීම, දෑතේ ඇඟිලි ගෙතීම.

3- සලාතය කරන හැඟිමෙන් තමාගේ සිතුවිලි වෙනස් කරවන දේවල් තමා ඉදිරියෙන් තබා ඇත්නම්, එම දිශාවට මුහුණ ලා සලාතය කිරීම.

4- මල මුත්‍ර හිර කරගනිමින් සලාතය කිරීම.

5- අනිවාර්ය සලාතයක පළමු රක්ආත් දෙකෙහි දී අල් ෆාතිහා පරිච්ඡේදය පමණක් කියවීම.

6- ආහාර සූදානම් කර ඇති අවස්ථාවක සලාතය කිරීම.

7. සිය වස්ත්‍රය නමාගනිමින් හෝ ඔසවාගනිමින් සලාතයෙහි නියැළිම.

එවැනි තවත් නොමනා දෑ කිරීම.

රෝගියාගේ සලාතය

කිසිදු අවස්ථාවක වැඩිවියට පත්, නිසි බුද්ධියකින් යුතු මුස්ලිම්වරයාට අනිවාර්ය සලාතය කෙරෙහි ඇති වගකීම බිඳ නොවැටේ. අනිවාර්ය සලාතය කෙරෙහි ඇති වගකීම බිඳ වැටෙන අවස්ථාවක් නම් එය කාන්තාවකගේ මාස් ශුද්ධිය හා පසු ප්‍රසව රුධිර වහනය වීමේ කාල වකවානුව තුළ දී පමණ යි. එබැවින් මුස්ලිම්වරයා මෙම වගකීම නිතින ඉටු කිරීමට බැඳී සිටියි.

එහෙත්, මුස්ලිම්වරයා රෝගී වූ විට හෝ, සලාතය ඉටු කිරීමට යම් අසීරුතාවයක් සිදු වූ විට ඔහු කළ යුත්තේ කුමක් ද?

මිනිසාගේ ශක්තියට හා හැකියාවට ඉහළින් ඒවා අබිබවමින් කිසිදු හෝ දෙයක් උත්තරීතර අල්ලාහ් මිනිසා කෙරෙහි අනිවාර්ය නොකරන්නේ උතුමාණන්ගේ දයාලුභාවය නිසාවෙනි. එහෙයින්, මුස්ලිම්වරයා රෝගී වී, සිටගෙන සලාතය කළ නොහැකි වූ විට අනිවාර්ය සලාතයේ දී සිටගනිමින් සලාතය කිරීමේ වගකීම ඔහුගෙන් බිඳ වැටේ. එකල, ඔහු වාඩි වී සලාතය කරමින් අනෙකුත් මූලිකාංග හැකි සේ ඉටු කළ යුතු යි. එසේ ම, ඔහුට රුකූඃ සහ සුජූද් කිරීමට පවා නොහැකි නම් ඔහු එම ඉරියව් සිදු කරන්නා සේ ඉඟි කළ යුතු යි. (වාඩි වී සලාතය කරනා විට ඉඟි කිරීම යනු තමන්ට හැකි පරිදි කොන්ද නමා පහත් වීම යි. මෙහි දී රුකූඃ ඉරියව්වට වඩා සුජූද් ඉරියව්වේ දී වැඩි වශයෙන් කොන්ද නමා පහත් විය යුතු වේ.) රුකූඃ ඉරියව්ව සාමාන්‍ය පරිදි කිරීමට හැකි නමුත් සුජූද් ඉරියව්ව අපහසු නම් හෝ සුජූද් ඉරියව්ව සාමාන්‍ය පරිදි කිරීමට හැකි නමුත් රුකූඃ ඉරියව්ව අපහසු නම් හැකි දේ කරමින් නොහැකි දේ ඉඟි කළ යුතු යි.

වාඩි වී හෝ සලාතය කිරීමට නොහැකි විටක, සිය මුහුණ කිබ්ලා හෙවත් නැමදුම් දිශාවට මුහුණ ලා තබමින් පැත්තකට ඇල වී හැකි අයුරින් සලාතය කළ යුතු යි. රුකූඃ සහ සුජූද් කරන්නා සේ ඉඟි කළ යුතු යි.

පැත්තකට ඇල වී හෝ සලාතය කිරීමට නොහැකි නම්, උඩු බැලි අතට නිදාගනිමින් සිය දෙකකුල් කිබ්ලා දිශාවට පෙරටු කර තබමින් ද තමාට හැකි නම් සිය හිස ඔසවා තබා ගනිමින් ද රුකූඃ හා සුජූද් කරන්නා සේ ඉඟි කරමින් ද සලාතයේ නිරත විය යුතු යි.

ඇතැම් ඉරියව් කරන්නා සේ ඉඟි කිරීමට පවා නොහැකි නම් එය ද ඔහුට අනිවාර්ය නොවන අතර කිබ්ලා දිශාවට පෙරටු කරමින් රුකූඃ හා සුජූද් කරන්නා සේ චේතනා කරගත යුතු වේ.

රෝගියාගේ සලාතයට අදාළ නියමය

තමාට ඉටු කිරීමට පුළුවන් වගකීම් ඉටු කළ යුතු වේ. නැතිනම් තමාට පුළුවන් දෙයක් කළ යුතු වේ. තමාට කිරීමට නොහැකි වන දෑ සිය වගකීමෙන් බිඳ වැටේ.

මඟියාගේ සලාතය:

ඉස්ලාමය තුළ සහනය සැලසීමේ එක් නිදර්ශනයක් නම්, මඟියාට ඔහුගේ සලාතයේ දී සලසා දෙන සහනය යි. රක්ආත් සතරක සලාතය ඔහුට කෙටි කර ඉෂ්ට කිරීමට ධාර්මික නීතියෙන් අවකාශය ලබා දී ඇත. ලුහ්ර්, අස්ර් සහ ඉෂාඃ යන මෙකී සලාතයන් තුන ම රක්ආත් දෙකකට පමණක් සීමා කරමින් කෙටි කර ඉටු කිරීමට අවසර ය.

කාන්තාවකගේ සලාතයෙහි පවත්නා විශේෂ නීතිරීති

සලාතයට අදාළ නීතිරීතිවල කාන්තාව ද පුරුෂයා හා පරිපූර්ණ ලෙස සමාන වේ. එහෙත්, ඇතැම් නීතිරීතිවලින් කාන්තාව පුරුෂයාගෙන් විශේෂත්වයක් ලබන්නීය. ඒවා නම්׃

- මාස් ශුද්ධිය හා පසු ප්‍රසව රුධිර වහනය වීමේ කාල වකවානුව තුළ කාන්තාව කෙරෙන් සලාතය කිරීමේ අනිවාර්ය වගකීම බිඳ වැටේ. එම කාලය අවසන් වූ පසු ව ද මඟහැරුණු එම සලාතයන් නැවත ඉටු කිරීම ද ඇයට අනිවාර්ය නැත.
- ජුමුආ සලාතයට වාර්තා කිරීම කාන්තාවට අනිවාර්ය නැත.
- අනිවාර්ය සලාතයන් සාමූහික වශයෙන් ඉෂ්ට කිරීම ද කාන්තාවට වගකීමක් නොවේ.
- සලාතය ඉටු කරනා විට සිය මුහුණ හා දෙඅත් මැණික් කටුවලට පහළ කොටස හැර අනෙකුත් සම්පූර්ණ ශරීරය ආවරණය කරගැනීම කාන්තාවට අනිවාර්ය වේ.

සමාප්තිය:

උත්තරීතර මහිමාන්විත අල්ලාහ්ගෙන් අප හට ද අපගේ සොයුර සොයුරියන් හට ද මුස්ලිම් පිරිමින්ට ද මුස්ලිම් කාන්තාවන්ට ද ධර්මයේ මූලිකාංගයක් වන මෙම මහඟු වගකීම මහිමාන්විත අල්ලාහ්ගේ තෘප්තිය අත්පත් කරගන්නා අයුරින් ස්ථාපිත කිරීමට ආශිර්වාද කරන ලෙස අයැද සිටිමු. දෙවිඳාණන්ගේ කලයාණ මිත්‍ර දේව දූත ඉබ්‍රාහීම්තුමා අයැදූ ප්‍රාර්ථනාවක් අපි ද අයදිමු. **“පරමාධිපතියාණනි, මා ද මාගේ පරපුරෙන් පැමිණෙන්නන් ද සලාතය ස්ථාපිත කරන්නන් ලෙස පත් කරනු මැනවි! අපගේ පරමාධිපතියාණනි, ප්‍රාර්ථනාව ද පිළිගනු මැනවි!”**

සර්වඥ වන්නේ අල්ලාහ් ම ය, උතුමාණන්ගේ ගැත්තා හා දූතයා වන මුහම්මද්තුමා කෙරෙහි උතුමාණන්ගේ ආශිර්වාදය හා අභිවෘද්ධිය අත් වේවා!

ඇගයීම

1 නිවැරැදි නම් නිවැරැදි ලෙස හෝ වැරදි නම් වැරදි ලෙස දක්වන්න.

☐ සලාතය වනාහි ගැත්තා හා සිය පරමාධිපතියා අතර පවත්වාගන්නා සම්බන්ධතාවයකි. එහි දී ගැත්තා මහිමාන්විත අල්ලාහ් අබියස උතුමාණන්ගේ ශ්‍රේෂ්ඨත්වය හා මහිමය ඉදිරිපත් කරනු පිණිස සිටගන්නේය.

☐ සලාතය තුළ බැතිමත්භාවයෙන් සිටීමේ විෂයෙහි අනවධානයෙන් සිටීම මඟින් සලාතයෙන් හිමි වන කුලිය අවම වන්නේය.

☐ මුස්ලිම්වරයෙකු පාපියෙකු වුව ද, සිය ආත්මය වරදට යොමු වීම සම්බන්ධයෙන් තැකීමක් නොමැත්තෙකු වුව ද ඔහු කෙරෙහි සලාතය අනිවාර්ය වේ.

☐ කිබ්ලාව යන්නෙන් අදහස් කරනුයේ මක්කාව පිහිටා ඇති දිශාව යි.

☐ මුස්ලිම්වරයෙකුගේ සලාතය චේතනාවකින් තොර ව නිවැරැදි වේ.

☐ අල් ෆාතිහා පරිච්ඡේදය කියවීම වනාහි මූලිකාංගයකි. කියවීමට හැකියාවක් ඇත්තෙකු එයින් තොර ව සලාතය කරන්නේ නම් ඔහුගේ සලාතය නිවැරැදි නොවේ.

☐ මාස් ශුද්ධියට හා පසු ප්‍රසව රුධිර වහනයට පාත්‍ර කාන්තාවට හැර වැඩි වියට පත්, නිසි බුද්ධියකින් යුක්ත මුස්ලිම්වරයෙකුගෙන් සලාතයේ වගකීම බිඳ නොවැටේ.

☐ මඟියාට රක්ආත් හතරක සලාතය රක්ආත් දෙකකට පමණක් සීමා කරමින් කෙටි කර එම සලාතය ඉටු කිරීමට ධාර්මික ව අවසර ය.

☐ ජුමුආ සලාතය සහ සාමූහික සලාතය කාන්තාවන්ට අනිවාර්ය නැත.

☐ සිටගැනීමට හැකියාවක් නොමැත්තෙකු වාඩි වී සලාතය කිරීම නිවැරැදි ය.

☐ සලාතය අතරතුර අපගේ මුහුණ දෙපසට හැරවීම වරදක් නැත.

☐ සලාතය අතරතුර කතා කිරීමට සහ කෑමට අනුමැතිය ඇත.

☐ කිබ්ලා දිශාව දැනගැනීමට හෝ විමසා තහවුරු කරගැනීමට හැකි කෙනෙක් කිබ්ලා දිශාවෙන් තොර ව සලාතය කළේ නම්, ඔහුගේ සලාතය වලංගු වේ.

☐ සුජූද් කරන්නෙකු සිය දෙපා ඇඟිලි ඔසවමින් සුජූද්හි නිරත වුවහොත් ඔහුගේ සුජූද් ඉරියව්ව වැරදි ය.

ඇගයීම

2 පළමු රක්අාතයේ දී ඇති සුජූද් දෙකින් එක් සුජූදයක් අමතක වී ඒ බව දෙවන රක්අාතයේ දී මතක් වූ විට, අමතක වීමක් නිසා එක් සුජූදයක් පමණක් සිදු වූ පළමු රක්අාතය නිවැරැදි වේ ද?

☐ ඔව් ☐ නැත

3 නිවැරැදි පිළිතුර තෝරන්න.

1. මුස්ලිම්වරයාට උදේ හවස දෛනික ව පැවරෙන අනිවාර්ය සලාතයන් ගණන කොපමණ ද?

☐ හතකි ☐ පහකි ☐ දහයකි

2. සලාතය නිවැරැදි වීමට අදාළ කොන්දේසියක් වන්නේ:

☐ පිරිසිදුකම ☐ චේතනාව

☐ කිබ්ලා දිශාවට මුහුණ ලා සිටීම ☐ ඉහත සඳහන් සියල්ල

3. රුකූඃ ඉරියව්වේ කියවිය යුතු දේව දූත සම්ප්‍රදාවලින් වාර්තා වූ ප්‍රකාශයක් වන්නේ:

☐ සුබ්හාන රබ්බියල් අඃලා

☐ සුබ්හාන රබ්බියල් අළීම්

☐ අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්

4. පළමු තෂහ්හුද් අවසන් කර සිට ගැනීමෙන් පසු කළ යුත්තේ කුමක් ද?

☐ තක්බීර් පවසා, සෘජු ව සිටගෙන, අල් ෆාතිහා පරිච්ඡේදය පවසා, පසු ව රුකූඃ ඉරියව්වට යෑම

☐ තක්බීර් පවසා සුජූද් කිරීම

5. මල මුත්‍ර පහ කිරීමේ වුවමනාව ඇතු ව ම සලාතය කළ විට එහි නීති ස්ථාවරය කුමක් ද?

☐ නොමනා දෙයකි (මක්රූහ්)

☐ තහනම් (හරාම්)

☐ අවසර ය

ඇගයීම

4 පහත සඳහන් හිස්තැන් පුරවන්න.

1. ෂහාදා දෙකින් පසු ව ඇති ඉතා ශ්‍රේෂ්ඨ නැමදුම වන්නේ ....
2. මග්රිබ් සලාතය රක්ආත් .... සමන්විත වන අතර, ලුහ්ර් සලාතය රක්ආත් .... සමන්විත වේ.
3. සලාතය තක්බීරයෙන් අප ආරම්භ කරනා අතර .... අපි අවසන් කරගනිමු.
4. කාන්තාව සිය .... සහ .... හැර අනෙකුත් සියලු ශරීරය ආවරණය කරගැනීම ඇයට අනිවාර්ය වේ.

5 සලාතයේ මහිමයන් තුනක් දක්වන්න.

....

....

6 සලාතයේ වැදගත්කම විදහා පාන සාධකයක් දක්වන්න.

....

....

....

7 අවසන් තෂහ්හුද්හි කියවන වාග්පෙළ ලියා දක්වන්න.

....

....

....

8. සුජූද් දෙක අතර ඇති මැද හිඳුමේ කියවිය යුතු ප්‍රාර්ථනාව කුමක් ද?

....

9. සුජූද්හි කියවිය යුතු දෑ කුමක් ද?

....

10. සලාතයෙහි බැතිමත්භාවය වර්ධනය කරගැනීමට ඉවහල් වන ක්‍රියාමාර්ග හතරක් දක්වන්න.

....

11. රක්ආත් හතරකින් සමන්විත අනිවාර්ය සලාතයන් මොනවා ද?

....

12. මිනිසෙකු පුටුවක වාඩි වී සලාතය ඉටු කරයි. මන්ද ඔහුට පුටුවක හැර අන් ආකාරයකට වාඩි වීමට නොහැකි නිසා ය. එකල, ඔහුගේ සලාතය නිවැරැදි වේ ද?

....

13. වාජිබ් වූ පළමු තෂහ්හුදය වුවමනාවෙන් අතහැරියේ නම්, ඔහුගේ සලාතයේ නීති ස්ථාවරය කුමක් ද?

....

උසස් සංකේතයක් වන සලාතය

දිනකට පස් වතාවක් අනිවාර්ය ක්‍රියාවක් වශයෙන් මුස්ලිම්වරු උදේ හවස මෙම සලාතය ඉටු කරති. ඔවුන් තුළ ශක්තිය හා හැකියාව පවතින තුරු ඔවුහු එය අත් නොහරිති. සිය සුවපහසු නින්ද හා කාර්යබහුල රාජකාරීන් පවා සලාතය වෙනුවෙන් කැප කරති. එය වූ කලී, යමකින් භීතියට පත් ළදරුවෙක් සුරක්ෂිතභාවය පතා මව් තුරුලට වහා දුව එන්නා සේ ය. මුස්ලිම්වරයෙකු සිය පරමාධිපතිගේ ඒකීයත්වය සනාථ කිරීමෙන් පසු අධික ලෙස උනන්දුවෙන් ඉගෙනගත යුතු සහ ඉගැන්විය යුතු කාරණාවකි මෙම සලාතය. මෙම පොත් පිංච මඟින් තක්බීරයේ සිට සලාමය දක්වා සලාතයේ ක්‍රමවේද පහසු අයුරින් ද විස්තරාත්මක ව ද විග්‍රහ කර ඇත. එසේ ම ඒ හා බැඳුණු නීතිරීති හා ඵලප්‍රයෝජන ද සවිස්තර කොට ඇත.

එපරිද්දෙන් ම, පහත QR කේතය ස්කෑන් කිරීම හරහා සලාතය ඉටු කරනාකාරය පිළිබඳ දෘශ්‍ය පට තොරතුරු නැරඹිය හැකි යි.



ربَّنا ولكَ الحمدُ
حمدًا كثيرًا طيِّبًا مُبارَكًا فيه
4:25 / 13:42

مركز أصول
OsoulCenter
www.osoulcenter.com

CHAT & DECIDE

ඉස්ලාමය ගැන නොයෙකුත් භාෂාවලින් සාකච්ඡා කරන්න

GUIDE TO ISLAM

ඉස්ලාම් දහම පිළිබඳ වැඩි විස්තර සඳහා

දිනකට පස් වතාවක් අනිවාර්ය ක්‍රියාවක් වශයෙන් මුස්ලිම්වරු උදේ හවස මෙම සලාතය ඉටු කරති. ඔවුන් තුළ ශක්තිය හා හැකියාව පවතින තුරු ඔවුහු එය අත් නොහරිති. සිය සුවපහසු නින්ද හා කාර්යබහුල රාජකාරීන් පවා සලාතය වෙනුවෙන් කැප කරති. එය වූ කලී, යමකින් භීතියට පත් ළදරුවෙක් සුරක්ෂිතභාවය පතා මව් තුරුලට වහා දුව එන්නා සේ ය. මුස්ලිම්වරයෙකු සිය පරමාධිපතිගේ ඒකීයත්වය සනාථ කිරීමෙන් පසු අධික ලෙස උනන්දුවෙන් ඉගෙනගත යුතු සහ ඉගැන්විය යුතු කාරණාවකි මෙම සලාතය. මෙම පොත් පිංච මඟින් තක්බීරයේ සිට සලාමය දක්වා සලාතයේ ක්‍රමවේද පහසු අයුරින් ද විස්තරාත්මක ව ද විග්‍රහ කර ඇත. එසේ ම ඒ හා බැඳුණු නීතිරීති හා ඵලප්‍රයෝජන ද සවිස්තර කොට ඇත.

එපරිද්දෙන් ම, පහත QR කේතය ස්කෑන් කිරීම හරහා සලාතය ඉටු කරනාකාරය පිළිබඳ දෘශ්‍ය පට තොරතුරු නැරඹිය හැකි යි.

جائزة السبيعي للتميز في العمل الخيري

International Organization for Standardization ISO 9001

osoulcenter

www.osoulcontent.org.sa

භාෂා කිහිපයකින් මෙම පොත සහ වෙනත් පොත් බාගත කිරීම සඳහා

OSOUL STORE

osoulstore.com